


# ලාංකේය ජනප්‍රිය සංගීතයේ ප්‍රථම සහ එකම සුපිරි තරුව!

රසිකත්වය, ජනප්‍රිය සංස්කෘතිය, ප්‍රධාන ප්‍රවාහය සහ බලපෑම සම්බන්ධයෙන් බටහිර ලෝකයේ ඕනෑම වැසියකුගේ (පුරුෂ) අදහස විමසිය හැකි තනි ප්‍රශ්නයක් තිබෙනවා. මුළු බටහිරටම පොදු එම සරල ප්‍රශ්නයක් වන්නේ මෙයයි.

ඔබ බීට්ල්ස් මිනිහෙක් ද? එල්විස් (ප්‍රෙස්ලි) මිනිහෙක් ද?

වසර සියයකට ආසන්න, බටහිර ජනප්‍රිය සංගීතය එතරම් ලඝුකොට ගැනීමට හැකි වීම ඔබට පුදුමයක් විය හැකියි. එයට හේතුව ජෝන් ලෙනන් සහ පෝල් මැකාට්නි ප්‍රමුඛ බීට්ල්ස් සංගීත කණ්ඩායම සහ එල්විස් ප්‍රෙස්ලි නමැති ගායකයා (නළුවා) බටහිර ජනප්‍රිය සංස්කෘතියට කර ඇති අසීමිත අසමසම බලපෑමයි.

20 වන සියවසේ සිට ලොවට ජනප්‍රිය රැලි සැදුවේ ඇමරිකා එක්සත් ජනපදයයි. ඊට බොහෝ පසුපසින් දෙවැනි තැනට එන්නේ එක්සත් රාජධානියයි. එල්විස් ප්‍රෙස්ලි ඇමරිකානුවෙක්. බීට්ල්ස් සාමාජිකයින් එක්සත් රාජධානියේ පුරවැසියන්. ලෝක ඉතිහාසයේ ජනප්‍රිය සංගීත දර්ශක (ටොප් චාර්ට් - ස්වාධීන සහ අව්‍යාජ ලෙස ලොවම පිළිගත්) වල වැඩිම අංක එකේ ගීත ප්‍රමාණයක්, එනම් 21ක් එල්විස් ප්‍රෙස්ලිගේ නිර්මාණ. දෙවැනි තැන ලෙස අංක එකේ ගීත 17කට හිමිකම් කියන්නේ බීට්ල්ස් සංගීත කණ්ඩායම. අලෙවි වාර්තා සලකා බලද්දී එල්විස් ප්‍රෙස්ලි සහ බීට්ල් සංගීත කණ්ඩායම ඇල්බම් මිලියන 600 බැගින් අලෙවි වෙමින් ලොව වැඩිම අලෙවි වාර්තා තැබූ සංගීත ශිල්පීන් යුග්මය ලෙස සම සමව වැජඹෙනවා.



මුළු පෘථිවියේම දැවැන්තම කලා ශිල්පීන් වන්නට එල්විස්ට සහ බීට්ල්ස්ලට දශක ගණනාවක් ගත වෙන්නට ඇතැයි ඔබට සිතෙන්නට පුළුවන. මෙතරම් බලපෑමක් ලොවට කරන්නට ඔවුන් සමත් වූයේ ඉතාම කුඩා කාල පරිච්ඡේදයක බව විස්මයට කාරණයක්. බීට්ල්ස් කණ්ඩායම පැවැතුණේ අවුරුදු 10 (1960-1970) කි. එයිනුත් ඔවුන් උච්ඡත්වයේ සිටියේ වසර පහකටත් අඩු කාලයක්. එල්විස් ප්‍රෙස්ලිගේ නිර්මාණ දිවියේ උච්ඡතම කාල පරිච්ඡේදය පැවැතුණේ වසර 15කටත් අඩු ප්‍රමාණයක්. එයින් පිළිබිඹු වන්නේ ජනප්‍රියත්වය නොනැසී පැවැතීමට මූලිකව වැදගත් වන්නේ නිර්මාණ ප්‍රමාණයවත්, ක්ෂේත්‍රයේ රැඳී සිටි කාල සීමාවන් යනාදී කිසිවක් නොව, නිර්මාණවල ගුණාත්මකභාවය පමණක් බවයි.

1940 ඉපදුණු බීට්ල්ස් නායක ජෝන් ලෙනන් වයස අවුරුදු 30 වෙනකොට බීට්ල්ස් කණ්ඩායම හැර ගොස් ද හමාරයි. 1980 වයස අවුරුදු 40 දී ඔහු අකල් මරණයකට ගොදුරු වෙනවා. 1935 උපත එල්විස් (කිංග්) රජු යන අන්වර්ථ නාමයෙන් හැඳින්වී 1977 දී වයස අවුරුදු 42 දී අකල් මරණයකට මුහුණ දෙනවා. මොවුන්ගේ බලපෑම ලොව පවතින තුරාවටම ජනප්‍රිය සංස්කෘතියේ අංගයක් ලෙස රසිකයන් පිනවමින් පවතීවි. එවැනි කෙටි ජීවිත කාලයක් තුළ මෙතරම් ලෝකයක් සසල කිරීමට සමත් වූ නිර්මාණ ගොන්නකට පණ පෙවීම ඇත්තටම ආශ්චර්යයක්. ඔවුන් ලොව සදාකාලික සුපර් ස්ටාර්ස්ලා.

දැන් අපි අපේ කුඩා දිවයින දෙසට හැරෙමු. අපේ පුංචි කොදෙව්වේ, අපේ සංගීතයේ, ජනප්‍රිය ප්‍රවාහයේ එල්විස්, බීට්ල්ස්ට ලොව තිබුණු උන්මාදයට සමාන උන්මාදයකට හිමිකම් කියන්නට යම් ගායන ශිල්පියකු සමත් වූවා නම්, ඒ වික්ටර් රත්නායකයි. එදත් අදත් රසික උන්මාදයකට (කෘත්‍රිම නොවුණු අව්‍යාජ) පාත්‍ර වූ ප්‍රථම සහ එකම සංගීත ශිල්පියා වික්ටර් රත්නායකයි. ලෝක දැවැන්තයන්ට සාපේක්ෂව ශ්‍රී ලාංකේය පසුබිම තුළ වික්ටර් රත්නායකගේ සුවිශේෂත්වය සැසඳීම වස් අංශ දෙකක් මුල් කරගෙන පාඨක ඔබට කරුණු ගෙනහැර පෑමට මා කැමතියි.

### ජනප්‍රියත්වය

අද දින තම සංගීත දිවියට වසර 50ක් සපුරන වික්ටර් රත්නායක දශක පහක් පුරාවට තම ජනප්‍රියත්වය ශ්‍රී ලංකාව වැනි සාපේක්ෂව ඉතා කුඩා රසික ප්‍රජාවක්, කුඩා වෙළෙඳ පොළක් ඇති රටක අඛණ්ඩව රැකගෙන ඒමට සමත් වීම පැසසිය යුතු කරුණක්. හැටේ දශකයේ ලොව බීට්ල්ස් උන්මාදයටත්, එල්විස් ප්‍රෙස්ලි උන්මාදයටත් සැසඳිය හැකි ජනප්‍රියත්වයක් වික්ටර් හැත්තෑව දශකයේ ශ්‍රී ලංකාව තුළ ලබා ගත්තා. සංසන්දනාත්මකව බලන කල බටහිර ලෝකයේ සන්නිවේදනය ඒ වන විටත් අපේ දිවයිනට වඩා ගව් ගාණක



දියුණුවක් ලබා තිබුණා. රූපවාහිනී මාධ්‍යය ඒ වන විටත් ජනප්‍රිය වී තිබූ බැවින් බටහිර ගායන ශිල්පීන්ට තම ගායන හැකියාවට අමතරව රංගන හැකියාව, තම පෞරුෂය, රූප ස්වභාවයන් රසිකයන් හමුවට සජීවීව ගෙන යෑමට හැකියාව තිබුණා. එය ඔවුන්ගේ ජනප්‍රියතාව තව තවත් තීව්‍ර වීමට වාසිදායක ලෙස බලපෑවා. නමුත් වික්ටර් රත්නායකට තම හඬ මතම යැපෙමින්, මුද්‍රිත මාධ්‍ය කිහිපයක සරණින් තම ගායන පෞරුෂය රසිකයන් හමුවට ගෙන යාමට සිදුවුණා. එවැනි අල්ප සම්පත් ප්‍රමාණයකින් එතරම් ප්‍රතිචාරයක් හිමිකර ගැනීමට සමත් වීම ඔහුගේ ජනප්‍රියත්වයේ වටිනාකම වැඩි වීමට එක් හේතුවක්. වික්ටර් ඉහළින්ම බැබළුණේ අප රටේ ගුවන්විදුලි සේවාවන් දෙකක සහයෙන් සහ ඊ.පී., එල්.පී. තැටිවලින් පමණක් තම සංගීතය රසිකයන්ට බෙදා හැරීමෙන්. නමුත් වර්තමානයේ නිදහස් රේඩියෝ සංඛ්‍යාතයක්, සොයා ගැනීමට නොහැකි තරමට නාළිකා ගොන්නක් බිහිවී තිබියදීත්, රූපවාහිනී නාළිකා 42ක් විකාශය වෙද්දීත්, අන්තර්ජාලය සහ එය ඇසුරු කිරීමේ පහසුකම් ඉහළම දියුණුවකට පත් වී තිබෙද්දීත්, සමාජ වෙබ් අඩවි ජනප්‍රිය සංස්කෘතිය හසුරුවද්දීත්, කැසට්, සීඩී පරයමින් එම්.පී. 3 තාක්ෂණය දුරකථනයෙනුත් ගීත ඇසීමේ පහසුකම් සලසා තිබියදීත්, ඒ සැමටත් වඩා විද්‍යුත් මාධ්‍ය, මාධ්‍ය සදාචාරය කෙලෙසමින් කෘත්‍රිම ලෙස ශිල්පීන්, නිර්මාණ සහ ජනප්‍රියත්වය නිෂ්පාදනය කරමින් පවතිද්දීත්, ඒවායින් බිහිවන මිථ්‍යා සුපර් ස්ටාර්ලට ඊළඟ සීසන් එක වෙනකන්වත් පැවැත්මක් නොතිබීමෙනුත් පෙනී යන්නේ, සුපිරි තරු නිෂ්පාදනය කළත් ඒවායේ පැවැත්ම තාවකාලික බවයි. මේ කිසිවකින් සහය නොලැබූ වික්ටර්ගේ අඛණ්ඩ ජනප්‍රියත්වයට මිලක් නියම කළ නොහැකි වන්නේ ඉහත දැක්වූ හේතු නිසාමයි. එල්.පී., ඊ.පී. තැටි, ඉන් පසු එයිට් ට්‍රැක් වී ඉන් පසු කැසට් පටි වී තවත් දියුණුවට ගොස් සංගත තැටි බවට අනුවර්තනය වී, වර්තමානයේ ඇඟිල්ලක් තරම් දත්ත ගබඩාවක එම්.පී. 3 ලෙසිනුත් දියුණුවට පත් වී ඇති ගීතය අනාගතයේ තව මොන තාක්ෂණ විපර්යාසවලට මුහුණ දේදැයි සිතාගත නොහැකියි. නමුත් මේ දශක ගණනක වෙනස් වෙමින් පවතින තාක්ෂණික පරිණාමනය තුළ වෙනස් නොවුණු වික්ටර්ගේ ගීතය ඒ.එම්. රේඩියෝ නාළිකාවේ සිට වර්තමාන එම්.පී. 3 දක්වාත් අනාගතයේ ඕනෑම තාක්ෂණික පරිණාමනයන් සමඟත් (අභාවයට නොගොස්) අත්වැල් බැඳගෙන සිටින්නේ එම නිර්මාණ තුළ ඇති අකාලික ගුණාත්මකභාවය හේතුවෙන්. එම නිසා වික්ටර් රත්නායකගේ ගී ක්ලැසික්ස් ලෙස හඳුන්වනවාට මගේ පුද්ගලික අකැමැත්තක් ඇත්තේ එම ඉංග්‍රීසි වචනයට සිංහල නිර්වචන කිහිපයක් ඇති බැවිනි. එම නිසා වික්ටර්ගේ ගීත ටයිම්ලස් ක්ලැසික්ස් යනුවෙන් විශේෂණ පදයක් ඈඳීමෙන් හැඳින්වීම වඩාත් අගනේ යයි මාගේ හැඟීමයි.

වික්ටර්
අඩසියවස
දශක පහක මියැසි පහස



පැවැත්ම

ඔබ විමසිලිමත් වුවහොත් පෙනී යන එක් වැදගත් කාරණයක් වන්නේ ලොව විසූ ශ්‍රේෂ්ඨ, නිර්මාණශීලීම, විශිෂ්ට, ජනප්‍රිය සංගීතවේදීන් නිරන්තයෙන්ම අකල් මරණවලට ගොදුරු වූ බවයි. 18 වන සියවසේ විසූ අවුරුදු 35න් මිය පරලොව ගිය මොසාර්ට්ගේ සිට 2011 මියගිය බ්‍රිතාන්‍ය පොප් ගායන තරුව එමී වයින්හවුස් දක්වාම ලොව ඉතිහාසය පුරාවටම අකාලයේ මියගිය දිදුලන තරු බොහොමයි. බටහිර සංගීත තරුවලට 27 කියන්නේ අසුබ අංකයක්. වයස අවුරුදු 27 දී මියගිය සංගීත තරු රැසක් සිටින බැවින් බටහිර සංස්කෘතිය තුළ 27 සමාජය නැතහොත් 27 ක්ලබ් යනුවෙන් සංකල්පයක් ක්‍රියාත්මක වෙනවා. ජිමී හෙන්ඩ්‍රික්ස් (ලොව බිහිවූ විශිෂ්ටතම ඉලෙක්ට්‍රික් ගිටාර් වාදකයා), ජැනිස් ජොප්ලින්, ජිම් මොරිසන්, කර්ට් කොබේන් සහ එමී වයින්හවුස් එම අභාග්‍යසම්පන්න සමාජයේ සමාජික සාමාජිකාවන් කිහිප දෙනෙක්. බඩී හෝලි, ටුපාක් ෂාකූර්, අලියාහ්, රිචී වේලන්ස්, සිඩ් විෂස්, හැන්ක් විලියම්ස්, ෆෙඩ්රික් ෂොපැන්, මයිකල් හචන්ස්, මෝසාර්ට්, බොබ් මාලේ, මාවින් ගේ, විට්නි හියුස්ටන්, ජෝන් ලෙනන්, ෆ්‍රෙඩී මර්කරි, එල්විස් ප්‍රෙස්ලි, ජෝන් ඩෙන්වර්, මයිකල් ජැක්සන් යන මේ සියලු දෙනා වයස අවුරුදු 53ට පෙර මෙලොවින් වෙන්වූ සුපිරි සංගීතවේදීන් අතරින් කිහිප දෙනෙක්. මෙයින් ස්වාභාවික හේතූන් මත මියගිය ගණන් අල්පයි. එසේ නම් මොවුන් මියගියේ කෙසේ ද? අසීමිත ජනප්‍රියත්වයත් සමඟ ඕනෑම ශිල්පියකුගේ ජීවිතයට හොඳ මෙන්ම නරක බලපෑම් ද ඇති වෙනවා. ජනප්‍රියත්වයේ අතුරුඵල ලෙස අසීමිත භෞතික සම්පත්, වරප්‍රසාද, සිවිල් බලය එම ශිල්පීන් කරා ඇදී එන්නේ නිතැතින්. භෞතික ලෝකයට ගනුදෙනුකරුවන් වන මෙම ශිල්පීන්ටත් එම බලපෑම් හේතුවෙන් යථාර්ථය සහ මායාව වෙනස් කර හඳුනාගත නොහැකි තත්ත්වයකට මුහුණ පාන්නට සිදු වෙනවා. බොහෝවිට එහි ප්‍රතිඵලයක් ලෙස නොයෙක් දුසිරිත් ඔවුන් වෙළා ගන්නවා. ඉහත නම් සඳහන් කළ ශිල්පීන්ගෙන් බොහොමයක් ඝාතනයට ලක්වීම, බීමත්කම, රිය අනතුරු. ගුවන් අනතුරු, මත්ද්‍රව්‍ය භාවිතය, ඒඩ්ස් රෝගය, බෙහෙත් වර්ග අනිසි ලෙස පරිහරණය කිරීම සහ සියදිවි නසා ගැනීම හේතුවෙන් අකාලයේ මෙලොව හැර ගියා. මේ අසීමිත ජනප්‍රියත්වය සහ එය දරා ගැනීමට නොහැකියාව නිසා පෘථග්ජන මිනිසුන් හැටියට මේ විශිෂ්ට නිර්මාණ ශිල්පීන්ට අත්වූ ඉරණම ගැන කල්පනා කරද්දී අපේ වික්ටර් රත්නායක අපිට ආඩම්බර විය හැකි ආදර්ශවත් චරිතයක්. තම ජීවන රටාව මනා පාලනයකින්, සංයමයකින්, විනයකින් සදාචාරවත්ව ගෙවීමට ඔහු මැදුම් පිළිවෙත තෝරා ගත් බැවින් වසර 70ක් සපිරෙද්දීත් තම සංගීත දිවියට අඩ සියවසක් සරමද්දීත් වික්ටර් මනා කායික සහ මානසික සෞඛ්‍යයකින් අපට තවමත් නිර්මාණ මිහිර බෙදමින්




සිටීම රසික අප සැමගේ භාග්‍යයක්. ඔහුගේ ආදර්ශවත් දිවිමඟ ලෝකයත් සමඟ සැසඳීමේ දී වික්ටර්ගේ සුවිශේෂත්වයට මහඟු ආලෝකයක්.

සුපිරි තරු සංකල්පය රසිකයින්ගේ මනසට බලෙන් ඇතුළු කළ හැක්කක් නොවේ. නිරන්තරයෙන් අත්විඳීමට සලස්වා රසිකයින් මෝහනයට පත්කොට සුපිරි තරු ඔවුන්ගේ සිත් තුළට කාවද්දන්නට හැකියි සිතනවා නම් එය රසිකයින්ගේ බුද්ධියට නිගා කිරීමකි. ඉතා ඉක්මනින් එය තේරුම් ගන්නා රසිකයා ඊටත් ඉක්මනින් ව්‍යාජ තරු හැර යන්නේ ඔවුන්ගේ පැවැත්ම නින්දා සහගත ලෙස තාවකාලික කරමිනි. බොරු තරුවල ආයු කාලය ඉතාමත් අවම වෙමින් පවතින වර්තමාන ශ්‍රී ලංකාවේ, වික්ටර් දිනෙන් දින තව තවත් බැබළෙන්නේ නිකැළැල් දිවියක සහ ප්‍රතිපත්තිගරුක ගමන් මඟක යන ප්‍රතිඵල අත්විඳිමිනි. ශ්‍රී ලාංකේය ජනප්‍රිය සංගීතයේ සැබෑ සුපිරි තරුව යන ඔටුන්න වික්ටර් රත්නායකට බලෙන් පැළඳවූවක් නොවේ. එය වෙළෙඳ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක්වත්, රසික පරමාධිපත්‍ය පැහැර ගැනීමක්වත්, කෘත්‍රිම ලෙස අහසට ප්‍රක්ෂේපණය කර තරුවක් ලෙස රටට පෙනෙන්නට සැලැස්වූ බොරු අවතාරයක්වත් නොවේ. වික්ටර් රත්නායක එය උපයා ගත්තේ තම නිර්මාණ ප්‍රතිභාවයෙන් සහ ගායන කෞශල්‍යයෙන් පරම්පරා ගණනක රසික හදවත් තුළ කිරුළු පැලඳීමෙන් පමණකි.

ඇමරිකා එක්සත් ජනපදයේ බිහිවුණු ශ්‍රේෂ්ඨතම ජනාධිපතිවරයා ලෙස සැලකෙන ඒබ්‍රහම් ලින්කන්ගේ කියමනකින් මේ සටහන අවසන් කිරීම වඩාත් යෝග්‍යයයි සිතමි.

ඔබට හැම දෙනා ඇතැම් විටක රවටිය හැකිය.
ඔබට ඇතැම් දෙනා හැම විටම රවටිය හැකිය.

නමුත් ඔබට කිසි දිනෙක හැම දෙනාම හැම විටම රවටිය නොහැකිය.

**වින්දන ආරියවංශ**

